# නොබෙල් ත්‍යාගලාභීන් 2019

අපේක්ෂා හේරත්




නොබෙල් ත්‍යාගය ලෝකයේ නව සොයාගැනීම්, විවිධ ක්ෂේත්‍ර වල අත්පත් කරගත් ජයග්‍රහණ සහ ඒවායේ උන්නතිය උදෙසා සිදු කල මෙහෙවර අගයමින් ලබා දෙන වඩාත්ම ගෞරවනීය සම්මානය ලෙස සැලකේ. එය ස්වීඩන් ජාතික නව නිපැයුම්කරු සහ කාර්මික ශිල්පී ඇල්ෆ්‍රඩ් නොබෙල් විසින් පරිත්‍යාග කරන ලද අරමුදලකින් වාර්ෂිකව පිරිනමන ජාත්‍යන්තර ත්‍යාගයකි. විවිධ පේටන්ට් බලපත්‍ර 355 කට හිමිකම් කියූ ඔහුගේ වඩාත් ප්‍රසිද්ධ සොයාගැනීම ඩයිනමයිට් ය. නොබෙල් ත්‍යාග සඳහා අරමුදල පිහිටුවන ලද්දේ ඇල්ෆ්‍රඩ් නොබෙල්ගේ අවසාන කැමැත්තෙන් කරන ලද පරිත්‍යාගයට අනුව ය. 1895 නොවැම්බර් 27 වන දින පැරිසියේ ස්වීඩන්-නෝර්වීජියානු සමාජ ශාලාවේදී අත්සන් කල සිය අවසන් කැමැත්තේ ගිවිසුම් ප්‍රකාරව ඔහුගේ ධනයෙන් වෙන් කල මුදලකින් නොබෙල් ත්‍යාග සඳහා අරමුදල පිහිටුවන ලදී.

ඔහුගේ අභිමතය පරිදි නොබෙල් ත්‍යාගය ප්‍රදානය කිරීමේ වගකීම දැරීම සඳහා නොබෙල් පදනම පිහිටුවන ලදී. 1901 දෙසැම්බරයේ ඇල්ෆ්‍රඩ් නොබෙල්ගේ අභාවයෙන් පස්වන සංවත්සරයේදී නොබෙල් ත්‍යාග ප්‍රථම වරට පිරිනමන ලදී. ශාස්ත්‍රීය, සංස්කෘතික හෝ විද්‍යාත්මක ක්ෂේත්‍රවල උන්නතිය උදෙසා සිදු කල මෙහෙවර අගයමින් මෙම ත්‍යාගය ප්‍රදානය කෙරිණි. සෑම නොබෙල්





ත්‍යාගයක්ම රන් පදක්කමක්, නොබෙල් ඩිප්ලෝමාවක් සහ නොබෙල් ත්‍යාග මුදලකින් යන අංග තුනකින් සමන්විත වේ. සාහිත්‍ය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සාමය, කායික විද්‍යාව හෝ වෛද්‍ය විද්‍යාව ඇතුළු කාණ්ඩ සඳහා ත්‍යාග 1901 දී ප්‍රථම වරට ප්‍රදානය කරන ලදී. පසුව ආර්ථික විද්‍යාව සඳහා වන ත්‍යාගය 1968 දී හඳුන්වා දෙන ලදී. නොබෙල් ත්‍යාගය එක් පුද්ගලයෙකු වෙත හෝ පුද්ගලයන් දෙදෙනෙකු හෝ තිදෙනෙකු අතර සමානව බෙදී යන පරිදි ප්‍රදානය කරනු ලැබේ. පළමුවන ලෝක



එම්. ස්ටැන්ලි විටින්හැම්



අකිරා යොෂිනෝ



ජෝන් ගුඩ්නොෆ්

සංග්‍රාමය (1914-1918) සහ දෙවන ලෝක සංග්‍රාමය (1939-1945) කාලය තුළ නොබෙල් ත්‍යාගය වසර ගණනාවක් සඳහා ප්‍රදානය නොකෙරුණි. නොබෙල් ත්‍යාග අතරින් භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ කායික විද්‍යාව හෝ වෛද්‍ය විද්‍යාව යන කාණ්ඩ සඳහා වන ත්‍යාග අවම වශයෙන් මතභේදාත්මකය. සාහිත්‍යය හා සාමය සඳහා වන ත්‍යාග ක්ෂේත්‍රයේ ස්වභාවය නිසා තීරණාත්මක වෙනස්කම් කිහිපයකට නිරාවරණය වී තිබේ. ඒ අනුව, නොබෙල් සාම ත්‍යාගය බොහෝ අවස්ථා වලදී අත්හිටුවා ඇත.

මෙම ලිපිය 2019 නොබෙල් ත්‍යාගලාභීන් පිළිබඳ කෙටි විස්තරයක් ඉදිරිපත් කරයි.

## රසායන විද්‍යාව

රසායන විද්‍යාව සඳහා නොබෙල් ත්‍යාගය 1970-1980 කාලය තුළ ලිතියම්-අයන බැටරි නිපදවීම සඳහා කළ දායකත්වය වෙනුවෙන් විද්‍යාඥයන් තිදෙනෙකු වන ජර්මන් ජාතික ජෝන් ගුඩ්නොෆ්, බ්‍රිතාන්‍ය ජාතික එම්. ස්ටැන්ලි විටින්හැම් සහ ජපන් ජාතික අකිරා යොෂිනෝ වෙත පිරිනමන ලදී. එම බැටරි ජංගම ඉලෙක්ට්‍රොනික උපාංග හා විදුලියෙන් ක්‍රියාත්මක වන වාහනවල බහුලව භාවිතා වේ. වර්තමානයේ ඒවා යුධමය හා අභ්‍යවකාශ යෙදීම්වල ජනප්‍රියය. ලිතියම්-අයන බැටරි යනු පසුගිය දශක කිහිපයේ තාක්ෂණික විප්ලවයේ මූලික අංගය ලෙස සැලකේ. ලිතියම්-අයන බැටරි බල ගැන්වෙන්නේ ලිතියම් අයන එක් ද්‍රව්‍යයක සිට තවත් ද්‍රව්‍යයක් හරහා ගමන් කිරීමෙනි. කලින් ආරෝපණය කළ හැකි බැටරි වර්ග වලට වඩා ඒවා සැහැල්ලු හා සංයුක්ත වන අතර ඒවායේ ආරෝපණය වැඩි කාලයක් රඳවා තබා ගත හැකිය.

## භෞතික විද්‍යාව


විශ්වයේ පරිණාමය සහ විශ්වයේ පෘථිවියේ ස්ථානය අවබෝධ කර ගැනීම සඳහා කරන ලද දායකත්වය වෙනුවෙන් මෙම ත්‍යාගය පිරිනමන ලදී. මෙම ත්‍යාගය නොබෙල් ත්‍යාගලාභීන් තිදෙනෙකු වෙත පිදෙන ලදී. ජේම්ස් පීබල්ස් වෙත භෞතික විශ්ව වේදය පිළිබඳ න්‍යායාත්මක සොයාගැනීම් සඳහා වන අතර අනෙක් භාගය ස්විස් ජාතික මයිකල් මේයර් සහ ඩිඩියර් ක්වෙලොස් එක්ව හිරු මෙන් දිස්වෙන තරුවක් වටා පිහිටි ග්‍රහලෝකයක් සොයා ගැනීම වෙනුවෙන් පිදෙන ලදී. පිලිප් ජේම්ස් එඩ්වින් පීබල්ස් කැනේඩියානු-ඇමරිකානු තාරකා භෞතික විද්‍යාඥයෙකු, තාරකා



පිලිප් ජේම්ස් එඩ්වින් පීබල්ස්



ඩිඩියර් ක්වෙලොස්



මයිකල් මේයර්

විද්‍යාඥයෙකු ලෙස කටයුතු කරයි. ඔහු අඳුරු පදාර්ථ, කොස්මික් මයික්‍රෝවේව් පසුබිම සහ ව්‍යුහය ගොඩනැගීම යන ක්ෂේත්‍රවල සැලකිය යුතු මැදිහත් වීමක් ඇති ප්‍රමුඛ න්‍යායාත්මක විද්‍යාඥයෙකු වේ. ඔහුගේ බොහෝ සොයා ගැනීම් විශ්වයේ ආරම්භය තීරණය කිරීම පිණිස උපකාරී වී ඇත.

## වෛද්‍ය විද්‍යාව

ඇමෙරිකානු ජාතික ටී. විලියම් ජී. කෙලින්, බ්‍රිතාන්‍ය ජාතික ශ්‍රීමත් පීටර් ජේ. රැට්ක්ලිෆ් සහ ඇමෙරිකානු ජාතික ග්‍රෙග් එල්. සෙමෙන්සා වෙත කායික විද්‍යාව හෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳ නොබෙල් ත්‍යාගය පිරිනමන ලද්දේ වෙනස් වන ඔක්සිජන් මට්ටම ශරීරයේ සෛලවලට සංවේදවන ආකාරය සහ එම තත්වයට අනුවර්තනය වන අන්දම සොයා ගැනීම සඳහා ඔවුන් දැක්වූ දායකත්වය අගය කිරීමෙනි. විවිධ ඔක්සිජන් සාන්ද්‍රණ යටතේදී ජානවල ක්‍රියාකාරිත්වය නියාමනය කරන අණුක ක්‍රියාවලි ඔවුන් විසින් අනාවරණය කර එතුලින් සෛලීය පරිවෘත්තීය හා භෞතික විද්‍යාත්මක ක්‍රියාකාරිත්වය සඳහා විවිධ ඔක්සිජන් සාන්ද්‍රණවල බලපෑම අවබෝධ කර ගැනීම සඳහා පදනම ස්ථාපිත කර ඇත. රක්තහීනතාවය, පිළිකා සහ තවත් බොහෝ රෝග වලට එරෙහිව සටන් කිරීම සඳහා නව ප්‍රතිකාර ක්‍රම වර්ධනය කිරීම සඳහා මෙම සොයා ගැනීම ප්‍රයෝජනවත් වේ.



ටී. විලියම් ජී. කෙලින්



ශ්‍රීමත් පීටර් ජේ. රැට්ක්ලිෆ්



ග්‍රෙග් එල්. සෙමෙන්සා

## සාහිත්‍යය

සාහිත්‍ය ක්ෂේත්‍රයේ නොබෙල් ත්‍යාගලාභීයා ලෙස පීටර් හැන්ඩ්කෙ පිළිගැනීමට ලක් වූයේ ඔහුගේ භාෂාමය දක්ෂතාවයෙන් මානව අත්දැකීම්වල සුවිශේෂතා සහ මායිම් ගවේෂණය කිරීම සඳහා සිදු කරන ලද දායකත්වය නිසාය. පීටර් හැන්ඩ්කෙ විසිවන සියවසේ දෙවන භාගයේදී නවකතාකරුවෙකු, නාට්‍ය රචකයෙකු, පරිවර්තකයෙකු, කවියෙකු, චිත්‍රපට අධ්‍යක්ෂවරයකු සහ තිර රචකයෙකු ලෙස ප්‍රකට විය.



පීටර් හැන්ඩ්කෙ

ඔහුගේ රචනා වල සුවිශේෂී ලක්ෂණ වන්නේ සාමාන්‍ය භාෂාව භාවිතා කිරීම සහ ජීවිතයේ යථාර්ථය සහ මානව මානසික තත්වයන් ආමන්ත්‍රණය කිරීමයි. "Goalie's Anxiety at the Penalty Kick" ඔහුගේ සුප්‍රසිද්ධ නවකතාව ලෙස හඳුනාගෙන ඇති අතර එය අර්ථ විරහිත මිනීමැරුමක් කර ඔහුව අත්අඩංගුවට ගන්නා තෙක් බලා සිටින හිටපු පාපන්දු ක්‍රීඩකයෙකු වටා ගෙතී ඇත.




"The Left-Handed Woman" යනු තම ස්වාමිපුරුෂයාගෙන් වෙන් වූ පසු ඇයට දැනෙන ව්‍යාකූලත්වයට මුහුණ දෙන තරුණ මවකගේ විචක්ෂණ විස්තරයකි. "A sorrow beyond dreams" යනු අර්ධ ස්වයං චරිතාපදාන නවකතාවක් වන අතර එහි ඔහුගේ මියගිය මව පිළිබඳ මතකයන් ඇතුළත් වේ. "Repetition, slow homecoming, Short letter, long farewell, The Moravian night, A journey to rivers" ඔහුගේ



මයිකල් ක්‍රෙමර්



එස්තර් ඩුෆ්ලෝගේ



අභිජිත් බැනර්ජි

තවත් නවකතා කිහිපයකි. ඔහුගේ චිත්‍රපට අතර "Wings of desire, The wrong move, The absence, City of angels, The wings of the dove, The Goalie's Anxiety at the Penalty Kick, The left-handed women" ප්‍රමුඛ ස්ථානයක් ගනී. Kasper, The hour we knew nothing of each other, Offending the audience, Storm still ඔහු විසින් රචිත ජනප්‍රිය නාට්‍ය වේ.

**සාමය**

අබී අහමඩ් අලි නොබෙල් ත්‍යාගය දිනාගත්තේ සාමය හා ජාත්‍යන්තර සහයෝගීතාව ළඟා කර ගැනීම සඳහා කළ දායකත්වය වෙනුවෙන් ය. අසල්වැසි එරිත්‍රියාව සමඟ දේශසීමා ගැටුම නිරාකරණය කිරීම සඳහා ඔහු තීරණාත්මක පියවරක් ගෙන තිබේ. ඔහු ඉතියෝපියාවේ ෆෙඩරල් ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ සිව්වන අග්‍රාමාත්‍යවරයා ලෙස 2018 අප්‍රේල් 2 සිට සේවය කරයි. ප්‍රතිසන්ධානය, සහයෝගිතාව සහ සමාජ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ඔහු දායක වී ඇත. තවද ඔහු නැගෙනහිර සහ ඊසානදිග අප්‍රිකාවේ තවත් බොහෝ සාම හා ප්‍රතිසන්ධාන ක්‍රියාවලීන්හි නිරත වී ඇත.



අබී අහමඩ් අලි

**ආර්ථික විද්‍යාව**

ගෝලීය දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වූ පර්යේෂණාත්මක ප්‍රවේශය වෙනුවෙන් ඇමෙරිකානු ජාතික මයිකල් ක්‍රෙමර්, එස්තර් ඩුෆ්ලෝ සහ අභිජිත් බැනර්ජි ඇතුළු ආර්ථික විද්‍යාඥයන් තිදෙනෙකුට මෙම ත්‍යාගය පිරිනමන ලදී. මයිකල් ක්‍රෙමර්ගේ පර්යේෂණ ක්ෂේත්‍රයන් ලෙස දරිද්‍රතාවය අවම කිරීම, අධ්‍යාපන ආර්ථික විද්‍යාව සහ සෞඛ්‍ය ආර්ථික විද්‍යාව හඳුන්වා දිය හැකිය. යෝජිත දරිද්‍රතා විරෝධී ක්‍රියාමාර්ගවල ඵලදායිතාවය තහවුරු කිරීම සඳහා ඔහු දායක විය. ප්‍රංශ ජාතික එස්තර් ඩුෆ්ලෝගේ පර්යේෂණ අංශ වන්නේ සංවර්ධනය වෙමින් පවතින රටවල පවතින ක්ෂුද්‍ර ආර්ථික ගැටළු වේ. පවුල් සංස්ථාවල හැසිරීම, අධ්‍යාපනය, සහ සෞඛ්‍යයට ඇති ප්‍රවේශය පිළිබඳ අවධානය යොමු කෙරේ. අභිජිත් බැනර්ජිගේ කාර්යයන් සංවර්ධන ආර්ථික විද්‍යාව හා පාදක වන අතර ආර්ථික විද්‍යාවට අදාළ බොහෝ ග්‍රන්ථ රැසක් ඔහු විසින් සම්පාදනය කර ඇත. ආර්ථික විද්‍යාව හා සම්බන්ධ විවිධ සම්බන්ධතා සොයා ගැනීම සඳහා ඔවුන් තිදෙනාගේ ඒකාබද්ධ කාර්යයන් ඉවහල් වී ඇත.



ජාතික විද්‍යා පදනමේ
විද්‍යාව ප්‍රචලිතකිරීමේ අංශයේ
විද්‍යාත්මක නිලධාරී
**අපේක්ෂා හේරත්**
apeksha@nsf.gov.lk
0112696771

